# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat,1200/6, Rajamalwatta Road, Battaramulla.

☎ 011 279 7400
011 286 4051


මගේ අංකය / எனது இல / My No. L2/1/89/චක්‍රලේඛ/2023

ඔබේ අංකය / உமது இல / Your No

දිනය / திகதி / Date 2023.05. 31

චක්‍රලේඛ අංක 2022/03 (1)

සියළුම ප්‍රාදේශීය ලේකම්වරු,

<u>රජයේ ඉඩම් තුල ඛණිජ ද්‍රව්‍ය කැණීමේදී අනුගමනය කලයුතු ක්‍රියාමාර්ග</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මා විසින් නිකුත් කරන ලද 2022.02.22 දිනැති 2022/03 චක්‍රලේඛය හා මාගේ අංක L2/1/89/චක්‍රලේඛ/2022 හා 2022.09.07 දිනැති උපදෙස් ලිපිය හා බැඳේ.

02. භූ සම්පත් පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් නිකුත් කරන ලද ඛණිජ කැණීම, ප්‍රවාහනය හා වෙළඳාම පිළිබඳ කාර්ය සංග්‍රහයේ 6 ඡේදයේ ඇතුලත්වී ඇති ඒකීය ගාස්තු අය කිරිමේ ක්‍රමවේදය භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය විසින් මේ වනතෙක් ආරම්භ කර නොමැති බැවින්, 2023/05/03 පැවති භූ සම්පත් පිළිබඳ ජාතික අධීක්ෂණ කමිටුව විසින් ඒකාබද්ධ ගාස්තු අය කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක වන තෙක් පැරණි ක්‍රමවේදයට මුදල් අයකර ගැනීමට තීරණය කර ඇත.එබැවින් ඒකීය ගාස්තු අයකිරිමේ ක්‍රමවේදය ඉදිරියේදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය මඟින් ක්‍රියාත්මක වන තෙක්, මාගේ 2022/03 චක්‍රලේඛයේ 05 හා 06 ඡේදයන්හි සඳහන් කරුණු අනුව කැලෑ නිෂ්පාදන ගාස්තු අය කිරිම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය මඟින් සිදුකරනු ලබන බවට දන්වා ඇති උපදෙස්ද, මාගේ අංක L2/1/89/චක්‍රලේඛ/2022 හා 2022.09.07 දිනැති ලිපියේ 02 හා 04 ඡේදයන්හි උපදෙස් ද මෙයින් තාවකාලිකව අත්හිටුවනු ලැබේ.

03. ඒ අනුව මාගේ 2022/03 චක්‍රලේඛය නිකුත් කිරීමට පෙරාතුව ඔබ විසින් රජයේ ඉඩමක ඛණිජ කැණීම සම්බන්ධ කැලෑ නිෂ්පාදන ගාස්තු අය කරගන්නා ලද පැරණි ක්‍රමවේදයම, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය විසින් ඉදිරියේදී ඒකීය ගාස්තු ක්‍රමවේදය ක්‍රියාත්මක කරන තෙක් අදාල කරගත යුතු වේ.

04. භූ සම්පත් පිළිබඳ ජනාධිපති කාර්යය සාධක බලකාය විසින් නිකුත් කල උක්ත කාර්ය සංග්‍රහය මගින් ඛණිජ ඉවත් කිරීමට බඳුන් වූ හිස් අවකාශ රහිත වූ දෘඪ පරිමාව මත පිහිටා ගාස්තු අයකරන ලෙස දන්වා ඇති මුත්, මා අමතා ඇති වන සංරක්ෂණ ජනරාල්ගේ අංක DFC/PLE/06/06/2021 හා 2023/03/28 දිනැති ලිපිය මඟින් දෘඪ පරිමාව මත ගාස්තු අය කිරීම පිළිබඳ සංශෝධිත ගැසට් පත්‍රය පළ කිරීමේ කටයුතු නිමවන තෙක් එසේ දෘඪ පරිමාව මත පිහිටා ගාස්තු අය කිරීමට හැකියාවක් නොමැති බව දන්වා ඇත.එබැවින් 2021/02/25 දිනැති අංක 2216/34 හා 2009.05.06 දිනැති අංක 1600/18 ගැසට් පත්‍ර අනුව නිකුත් කල මාගේ 2021/2 චක්‍රලේඛ ප්‍රකාරව ගාස්තු අය කිරීම් සිදු කල යුතු වේ.

05. උක්ත උපදෙස් පදනම් කර ගනිමින්, ඛණිජ කැණීම් වලට අදාල නිෂ්පාදන ගාස්තු ඔබ විසින් කඩිනමින් අයකොට රාජ්‍ය ආදායමට බැර කල යුතු අතර,මේ සම්බන්ධව යම් ගැටළුවක් ඇති වුවහොත් මා විමසන මෙන් ද දන්වමි.

කේ.ඩී බන්දුල ජයසිංහ,
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් :-
01. සභාපති, භූ සම්පත් පිළිබඳ ජනාධිපති කාර්යසාධක බලකාය.
02. ලේකම්, සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය.
03. වන සංරක්ෂණ ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුව.
04. අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය.
05. සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරු/අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්වරු.
06. සියලුම අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස්වරු.


| | | | | |
|---|---|---|---|---|
| ආයතන / நிர்வாகம் / Admin ☎ 011 279 7479 / 011 287 3033 | ගිණුම් / கணக்கு / Accounts ☎ 011 287 5833 / 011 286 4462 | ඉඩම I / காணி I / Land I ☎ 011 287 4025 / 011 288 3812 | ඉඩම II / காணி II / Land II ☎ 011 287 5834 / 011 287 3110 | ඉඩම III / காணி III / Land III ☎ 011 279 7482 / 011 288 3635 |